# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 14,934/4 — 1970 දෙසැම්බර් 2 වැනි බදාදා — 1970.12.2

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී—බී. 47/53.

### අමාත්‍යවරුන්ගේ කාර්යයන් පැවරීමේ (ආනුෂංගික විධිවිධාන) පනත

#### 2 වැනි වගන්තිය යටතේ ආඥාව

මුදල් ඇමතිවරයා වෙත කලින් පවරා තිබුණු " විශ්‍රාම වැටුප් " යන විෂයය 1970 ජූනි මස 2 වැනි දින අංක 14,908/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජසභා ආඥාවේ 46(4) වැනි වගන්තිය යටතේ අගමැතිණිය විසින් කරන ලද පැවරීමෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා වෙත දන් පවරා ඇති හෙයින් ද,

ඒ පැවරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතැම් ලිඛිත නීතියක් සංශෝධනය කිරීම අවශ්‍ය වී ඇති හෙයින් ද,

අගමැතිණී සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මම (385 වැනි අධිකාරය වන) අමාත්‍යවරුන්ගේ කාර්යයන් පැවරීමේ (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයේ 1 වැනි තීරයේ දක්වා ඇති ලිඛිත නීති, ඒවාට අනුරූපව එම උපලේඛනයෙහි 2 වැනි තීරයේ දක්වා ඇති ආකාරයට හා ප්‍රමාණයට මෙම ආඥාවෙන් සංශෝධනය කරමි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අගමැතිණිය.

1970 දෙසැම්බර් 2 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය |
|---|---|
| 1. (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනත ... | (අ) 184(1) වැනි වගන්තියෙහි " මුදල් ඇමතිවරයාගේ අදහස් විමසීමෙන් පසුව ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය සහිතව " යන වචන වෙනුවට " ඇමතිවරයාගේ අනුමැතිය සහිතව " යන වචන ආදේශ විය යුතුය. |
| 2. 1959 අංක 7 දරන පළාත් පාලන (විශේෂ විධි විධාන) පනතින් සංශෝධිත (255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනත | (ආ) 172(අ) සහ 172(ආ) වැනි වගන්තිවල " මුදල් ඇමතිවරයාගේ අදහස් විමසීමෙන් පසුව ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය සහිතව " යන වචන යෙදෙන කවර ස්ථානයක වුව ද ඒ වචන වෙනුවට " ඇමතිවරයාගේ අනුමැතිය සහිතව " යන වචන ආදේශ විය යුතුය. |
| 3. 1959 අංක 7 දරන පළාත් පාලන (විශේෂ විධි විධාන) පනතින් සංශෝධිත (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනත | (ඇ) 172(අ) 172(ආ) යන වගන්තිවල " මුදල් ඇමතිවරයාගේ අදහස් විමසීමෙන් පසුව ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය සහිතව " යන වචන යෙදෙන කවර ස්ථානයක වුව ද ඒ වචන වෙනුවට " ඇමතිවරයාගේ අනුමැතිය සහිතව " යන වචන ආදේශ විය යුතුය. |
| 4. (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනත ... | (ඇ) 49(අ) සහ 49(ආ) යන වගන්තිවල " මුදල් ඇමතිවරයාගේ අදහස් විමසීමෙන් පසුව ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය සහිතව " යන වචන යෙදෙන කවර ස්ථානයක වුව ද ඒ වචන වෙනුවට " ඇමතිවරයාගේ අනුමැතිය සහිතව " යන වචන ආදේශ විය යුතුය. |

12–311

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි

910 11——ජේ 18758 – 11,050 (70/11)